# තමන් ගේ ආයු සංස්කාරය ගැන තමන් ම තීරණය කිරීම

ආචාර්ය
ජයන්ත කුමාරසිරි



ආයුෂ යන වචනයෙන් කියැවෙන්නේ මිහිපිට ජීවත්වන කාලය යි. දීර්ඝායුෂ විඳීමට මනුෂ්‍යයෝ කැමැත්තෝ ය. මියයාම යන සිදුවීම අසලට ම ආ මිනිස්සු තවත් එක් මොහොතක් හෝ ජීවත්වීමට ආශා කරන්නේ නම්, ඒ වූ කලි ස්වාභාවික වූවකි. යථාර්ථය ද එය යි.

මාතෘකාවට එසේ ප්‍රවේශ වුව ද මා, මෙහි දී සාකච්ඡා කරන්නේ සමස්තය ගැන නොවේ. මා, මෙම කාරණය තුළ සැරිසරණ ස්වභාවය ගැන ය. ඒ නිසා මේ වූ කලි මගේ පෞද්ගලික සමානුභූතිය යි.

බුදුරජාණන් වහන්සේ ඥාන දශකයක් පිළිබඳ ව දේශනා කළහ. ඥාන දශකය යනු පුද්ගලයා ගේ ජීවිතය තුළ ගෙවාදමන වයස් කාණ්ඩ අතුරෙන් අවුරුදු 40 සිට 50 දක්වා වූ කාලය යි. ඔය වයස මම ද ගෙවා දැමුවෙමි. සැබැවින් ම ඥාන දශකයේ සත්‍ය තත්ත්වය මා පසක් කරගත්තේ ද එම කාල වකවානුව තුළ දී ය. හිරිමල් වියේදීත්, තරුණ වියේදීත් මා සිතූ ඇතැම් දේ ගැන, ආපස්සට සිතන්නට (ප්‍රත්‍යාවර්තන චින්තනයට) විමර්ශන ඇස මෙහෙයවීමට මා පෙළඹුණේ, මේ කියූ ඥාන දශකයේ දී වීම ද විශේෂත්වයකි. එහි දී මා කළ කී ඇතැම් දේවල් සම්බන්ධයෙන් එදා මගේ ඒ තීරණ වැරදි බව දුටුවේ, මේ කියන ඥාන දශකයේ දී ම ය. එහෙත් මේ වනවිට හිරිමල් විය ද, තරුණ විය ද, ඉක්මගොස් මම, දිවිගමනේ පනහ දශකයට පැමිණ සිටිමි.

හිරිමල් වියේ දී මෙන් ම තරුණ වියේ දී මා සිතූ සෑම දෙයක් ම එලෙස වැරදිසහගත වූවා නොවේ. 'විප්ලවීය චින්තනය' සමග ගැටුමට බඳුන් ව තිබූ අතළොස්සක් වූ 'සමහර කරුණු' පමණි එලෙස නිවැරදි නොවන බවට හැඟුණේ, ඥාන දශකයේ මා ගතකළ කාලයේ දී. හිරිමල් වියේ දී මගේ සිතට වැදුණු එක් කරුණක්, දැන් පෙරටත් වඩා 'බුද්ධිමය තර්කයෙන්' මට සාක්ෂාත් කරන්නේ එය ඉතා නිවැරදි බවයි. ඒ කුමක්ද?

සතර ඍද්ධිපාද වැඩූ කෙනෙකු නිසා තමන් වහන්සේට ආයුෂ් කල්පයක් වැඩසිටිය හැකි යැයි බුදුරජාණන් වහන්සේ, ආනන්ද හිමියන්ට පැවසූයේ මාරයා පැමිණ බුද්ධායු කෙළවර කරන්නැයි ඉල්ලා සිටින්නට පෙර ය. එහෙත් බුදුහු එසේ ප්‍රකාශ කරද්දී වහවහා මාරයා, ආනන්ද හිමියන්ට ආවේශ වී උන්වහන්සේ ගේ සිහිය, අවසිහියට නැංවී ය. මෙසේ හෙයින් බුදුරජාණන් වහන්සේ, ආනන්ද හිමියන්ට කී කරුණ ආනන්ද හිමියන්ට තේරුම්ගියේ නැත. මේ නිසා ආනන්ද හිමියන්, බුදුරදුන්ට ප්‍රතිචාර දක්වමින් "එසේනම් ආයුෂ් කල්පයක් අප අතර වැඩහිඳිමින් ලෝ සතුන් ගේ හිතසුව පිණිස කටයුතු කරන්න භාග්‍යවතුන් වහන්ස" යැයි කියා හෝ, ඊට සමාන වෙනත් අදහසක් හෝ කියා ඉල්ලා සිටීමට අපොහොසත් වූයේ ය. නමුත් ආනන්ද හිමියන්ට මාරාවේශ වී සිහි විකල්කර ඇති බව උන්වහන්සේ දිවැසින් දුටු සේක. පෙර කී බුද්ධ වචනයට ආනන්ද තෙරුන් ප්‍රතිචාර නො දැක්වූයෙන් තවත් තෙමසකින් පිරිනිවන් පාන්නෙමැ යි බුදුහු තීරණයකට එළඹ මාරයාට ඒ බවට පොරොන්දු වූයේ ය.

මෙතැන දී මට ඇතිවන ප්‍රශ්න කිහිපයකි.

1. බුද්ධත්වයට පත්වීමේ දී මාරයාත්, මාරයා ගේ දියණිවරුනුත් පරාජය කළ බුදුහු, මෙම සිද්ධියේ දී මාරයා ගේ පෙර කී ක්‍රියාව නිසා, උන්වහන්සේ මාරයාට පරාජය වී ය.

2. ආනන්ද තෙරුන්ට මාරාවේශ වී සිහි විකල්කර සිටින බව දැනගත් සැනින් එක්කෝ, ආනන්ද හිමි වෙතින් මාරාවේශය ඉවත් කිරීමට බුදුන් වහන්සේට හැකියාව තිබුණි. ඇයි උන්වහන්සේ එවැන්නක් නො කළේ.

3. ආනන්ද තෙරුන්ට මාරයා ආවේශ වී සිහි විකල් කිරීම සැනෙකින් සිදු වූවකි. මාරයා කළ ඒ අනුචිත ක්‍රියාව නිසා, ඒ මොහොතේ තමන් වහන්සේ පිරිනිවන් පෑම සම්බන්ධයෙන් මාරයාට ප්‍රතිඥා ලබාදිය නො හැකි බව පැවසීමට බුදුරජාණන් වහන්සේට අවකාශ තිබුණි. නමුත් එසේ කළේ ද නැත.

4. බුද්ධ වචනය ශ්‍රවණය කිරීමට හා තමන් වහන්සේ ඇසූ පැනයකට පිළිවදන් සැපයීමට, තමන් වහන්සේ ගේ ම අග්‍ර උපස්ථායකයාට මග හරස්කර අවකාශ නැති කළ විටෙක බුදුන් වහන්සේ, මෙයින් තෙමසකට පසු මම පිරිනිවන් පාන්නෙමැයි මාරයාට ප්‍රතිඥා දීම නො කළ යුතු ව තිබුණකි.

5. මෙයින් තුන් මසකට පසු පිරිනිවන් පාන්නෙමැයි තීරණය කිරීම ම වූ කලි සැලසුම්සහගත ව පිරිනිවන්පෑමට තීරණය කිරීමක් වේ. පැහැදිලි කරගැනීමේ පහසුවට මෙම තීරණය පුද්ගලයෙකු සම්බන්ධයෙන් ආරෝපනය කළහොත්, 'මම තවත් තුනි මාසයකින් පසු මැරෙනවා' යැයි අද දින තීරණය කරන්නේ නම්, ඒ වූ කලි සැලසුම් සහගත මරණයකි. එවන් වූ මරණයක් ස්වාභාවික මරණයක් නොවේ. කල් තියා සැලසුම් කොට, සිය දිවි හානිකර ගැනීමකි. මේ නිසා බුදුරජාණන් වහන්සේ මුහුණපෑවේ ස්වාභාවික පිරිනිවන්පෑමකට නොවේ. ස්වයං සැලසුම්සහගත පිරිනිවන්පෑමකට ය.

මෙම 5 වැනි කරුණ පාදක ව තවදුරටත් මම මෙසේ කල්පනා කරමි. බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයෙකු ලෙස සිටිමින් මනුෂ්‍යත්වය උත්තරණය කළ උතුමෙකි. නමුත් මිනිසුන් විෂයෙහි සිදුවන සියලු ක්‍රියාකාරකම් උන්වහන්සේ විෂයෙහිත් සිදු වූහ. බුදු පදවිය ලද්දෝ ගිලන් ව, අන්‍ය උපකාරයෙන් ස්වකීය පිරිනිවන් මංචක උවටැන් ලබමින්, අනන්‍යනයන්ට ජුගුප්සාව ඇතිවන පරිදි ඔත්පළ ව පිරිනිවන් මංචකයේ සිටින්නෝ නො වෙති. එම තත්ත්වයට පත්වීමට පෙර බුදුවරු පිරිනිවන් පාති. එමග ම යමින් ගෞතම බුදුරජාණන් වහන්සේ ද මාරයාට ප්‍රතිඥා දුන් දින සිට තෙමසකින්, තමන් වහන්සේ පිරිනිවන්පාන බවට තීරණය කළහ. එනම්, පෙර කී පරිදි ම සැලසුම් සහගත ව එම තීරණයට පැමිණියෝ ය.

තමන් වෙනුවෙන් අනුන්ට කරදර නොදී, ඔවින් අපහසුතාවට පත් නොකර, ගිලන් ව ඔත්පල ව සිටීමේ ආදීනව තමන් ගේ මනසින් දකින ලදුව, එයින් තමන්ටත්, අනන්‍යයන්ටත් අපහසුතාවක්, පීඩාවක්, දෝමනස්සයක් අත්වීමට ඉඩ නොදී නිසි කල සිය දිවියේ, ජීවයෙන් ඉවත්වීම ජනතාවට තේරුම් ගැන්වීමට ගෞතම බුදුරජාණන් වහන්සේ ක්‍රියාකර ඇතැයි මට සිතේ.

මම උන්වහන්සේ ගේ අනුගාමිකයෙක්මි. එසේ ම මුල් බුදුදහම මිස, අද පවතින ජනප්‍රිය බුදුදහම තුළ මා නැත. බුදුරජාණන් වහන්සේත්, උන්වහන්සේ දේශනා කළ ධර්මයත් මම මුල් තැන්හි තබමි. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන ඵලවලින් එකකට පිළිපන් අෂ්ඨාර්ය පුද්ගල සංඝයා වහන්සේ ගැන ද මගේ සිත සුපිළිපන් ය. බුද්ධකාලීන ව විසූ සෙයියසක, උදායි වැනි තෙරුන් වහන්සේලා වුව ද, සුනීත, සෝපාක වැනි තෙරුන් වහන්සේලා වුව ද, රාහුල, අංගුලිමාල වැනි තේරුන් වහන්සේලා වුව ද මගේ ඒ සුපිළිපන් සිත තුළ වැඩවාසය කරන්නෝ වෙති.

බුදුරජාණන් වහන්සේ තවත් තෙමසකින් පිරිනිවන්පෑමට තීරණය කරන්නේ සද්භාවයෙනි. නැත්නම් යහපත් චේතනාවෙනි. එමෙන් ම හොඳ සැලසුමකින් ද යුතු ව ය. උන්වහන්සේ, තමන් වහන්සේ වෙතින් ඉටුවිය යුතු යුතුකම් සියල්ල ඉටු කළෝ ය. අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය පෙරදැරි ව පිරිනිවීම සඳහා බේලුව ගමේ දී සූදානම්වෙද්දී බුදුපියාණන් අතින් ඉටු නො වුණු කිසිදු යුතුකමක් අතහැරී හෝ මගහැරී හෝ තිබුණේ නැත. අවසානයේ, රෝගීභාවයේ වේදනාව ද සෙසු ශ්‍රාවකයින්ට පෙනෙන්නට සැලැස්වූ උතුමෙකි බුදුරජාණන් වහන්සේ. එහි, උන්වහන්සේ අසල සිටි අනාගාමී, අර්හත් මාර්ග ඵලවලට පත්වූවන්ගෙන් සංවේගප්‍රාප්ත නො වූවෝ කවරහුද? එමෙන් ම ඒ අවස්ථාවේ උන්වහන්සේ අසල සිටි එකී මාර්ගඵලවලට නො පැමිණි භික්ෂූන්ගෙන් කඳුළු නො සැලුණේ කාටද? එහෙත් බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේ පිළිබඳ ව නො සැලුණෝ ය. බුදු කෙනෙකු වෙතින් ඉටුවිය යුතු යුතුකම් සියල්ල සමාප්තකර තිබූ උන්වහන්සේ, තමන්වහන්සේ ප්‍රතිඥා දුන් පිරිනිවීම (බුද්ධ ජීවිතාවසානය) එලෙසින් ම වැළඳ ගැනීමට සූදානම් ව එඩිතර ව සිටියහ.

අමතක නො කළ යුතු ය. බුදුරජාණන් වහන්සේ මෙන් එලෙස සැලසුම්සහගත ජීවිතාවසානය දක්වා එඩිතර ව ගමන් කළ හැක්කේ, යහපත් සහ සුපිළිපන් (මනා සේ නිසි පැවැත්මෙන් ගතකළ) පුද්ගලයෙකු වශයෙන්, තමන්ට අදාළ සියලු යුතුකම් සම්පූර්ණයෙන් ම ඉටුකළ අයට පමණක් ය යන්න මගේ තීරණය යි. යුතුකම් මගහැර දැමූ, යුතුකම් අත්හළ, යුතුකම් ඉටුකිරීම අසම්පූර්ණ වූ කිසිවෙකුට ඒ සඳහා හිමිකම් නැතැයි මම සිතමි.

මෙම යථා තත්ත්වය ගිහියන්ට හෝ පැවිද්දනට කියාදීමට භික්ෂූන්ට හිමිකමක් නැත. මේ මොහොතේ මියයන අයෙකුට වුව ද මරණය යහපත් ය යන සිතිවිල්ල මනසට වැටෙන ආකාරයේ දෙසුමක් කිරීමට භික්ෂූන්ට නො පුළුවන. එසේ කිවහොත් භික්ෂූහු පාරාජිකා වෙති. බුදුරජාණන් වහන්සේ බුද්ධ වචනයෙන් එසේ රැකවල් යොදා ඇත්තේ ද ලෝකයා ගේ හිත සුව පිණිස සත්භාවයෙන් බව ද මම දකිමි.

jayantha.kumarasiri.9
jayanthakumarasirie@gmail.com

**තමන් වෙනුවෙන් අනුන්ට කරදර නොදී, ඔවින් අපහසුතාවට පත් නොකර, ගිලන් ව ඔත්පල ව සිටීමේ ආදීනව තමන් ගේ මනසින් දකින ලදුව, එයින් තමන්ටත්, අනන්‍යයන්ටත් අපහසුතාවක්, පීඩාවක්, දෝමනස-'සයක් අත්වීමට ඉඩ නොදී නිසි කල සිය දිවියේ, ජීවයෙන් ඉවත්වීම ජනතාවට තේරුම් ගැන්වීමට ගෞතම බුදුරජාණන් වහන්සේ ක්‍රියාකර ඇතැයි මට සිතේ.**

